# ඉතිහාසය

## අ.පො.ස.(උ/පෙළ)



The National e-learning Portal for The General Education

Start Your Learning Journey with e-thaksalawa

## කෝට්ටේ රාජධානිය (ක්‍රි.ව.1415 - 1521)

කෝට්ටේ රාජධානිය යනු ශ්‍රී ලංකාවේ මධ්‍යකාලීන යුගයේ දේශපාලන, ආර්ථික, ආගමික හා සාහිත්‍යමය වශයෙන් ඉතා දියුණු වූ රාජධානියක් වන අතර , එය ශ්‍රී ලංකා ඉතිහාසයේ “ස්වර්ණමය යුගයක්” නියෝජනය කරයි. කෝට්ටේ රාජධානිය පිහිටුවන ලද්දේ හයවන පරාක්‍රමබාහු රජතුමා විසිනි. ඔහුගේ පාලන සමය කෝට්ටේ යුගයේ ස්වර්ණමය යුගය ලෙස සැලකේ. කෝට්ටේ නගරය අද ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රදේශයේ පිහිටා ඇත. නගරය වටා තිබූ වගුරු බිම් සහ දිය අගල් නිසා එය ආරක්ෂිත බලකොටුවක් විය. මෙය මුලින් ම බලකොටුවක් ලෙස ගොඩනගනු ලැබුවේ ගම්පොල යුගයේ දි නිශ්ශංක අලකේශ්වරයන් විසිනි. මෙම යුගයේ දී ,වෙළඳාම හා කෘෂිකර්මාන්තය දියුණු වියෙ. සිංහල සාහිත්‍යය සහ කලා ශිල්ප වර්ධනයක් ඇති විය. විදේශ රටවල් සමඟ සබඳතා පැවැත්විණි. බුද්ධාගමට රාජ අනුග්‍රහය ලැබුණි. ක්‍රි.ව. 1505 දී පෘතුගාලය වෙතින් පැමිණි පෘතුගීසීන්ගේ බලපෑම වැඩි වීමත්, අභ්‍යන්තර ගැටුම් ඇති වීමත් නිසා කෝට්ටේ රාජධානිය දුර්වල විය. අවසානයේ කි.ව.1597 දී එය පෘතුගීසීන්ගේ පාලනයට යටත් විය.

## කෝට්ටේ රාජධානියේ පාලකයන්

### vi වැනි පැරකුම් (ක්‍රි.ව.1415 - 1467 )

සසිරි මානාවුළු පුරෙහි ඉඳු පරපුරින් ආ පිවිතුරු
සවුළු විජෙබා නිරිඳු පුත් පැරකුම් රජුන් හට මුනුබුරු
ළමැණි ජයමහලැන හිමි සුරතුරු වෙලු රන්ලිය පුරු
සුනෙත් මහ දෙව් බිසෝ හිමිලත් රජරුවක් සොඳ බුදුකුරු

- පැරකුම්බා පිරිත -

VI වැනි පැරකුම්බා රජු ක්‍රි.ව 1415 දී කෝට්ටේ තම අගනුවර කරගනිමින් ප්‍රථමයෙන් කෝට්ටේ නගරය රාජධානියක් බවට පත් කරන්නා ලදි. සුනේත්‍රා මහා දේවිය එතුමාගේ මව වූ අතර ළමැණි ජයමහලැන හෙවත් ජයමහලේ එතුමාගේ පියා විය. ඔහු කුරුණෑගල යුගයේ අවසාන පාලකයා වූ සවුළු විජයබා රජුගේ පුත් පස් වන පැරකුම් රජුගේ මුණුබුරෙකි. වීර අලකේශ්වර චීනයට අල්ලා ගෙන ගිය අවස්ථාවේ දී එම පිරිස අතර පැරකුම් රජුගේ පියා ද සිටින්නට ඇති බවද විශ්වාස කෙරේ. සුනෙත් මහා දේවිය පැරකුම් කුමරු ද සමග විදාගම විහාරයට ගොස් විදාගම හිමියන්ගේ අනුග්‍රහයෙන් බෙලිගල අසල ගමේ ප්‍රධානියෙකුගේ ආධාර යටතේ ජීවත් වූ බවත්, විදාගම හිමියන්ගේ හා රටේ ප්‍රධානීන් කතිකා කොට ක්‍රි.ව.1412 දී රයිගම දී රජ වූ බවත්, ඉන් අනතුරුව ක්‍රි.ව 1415 දී ජයවර්ධනපුර කෝට්ටේ නගරය තම පාලන මධ්‍යස්ථානය කර ගනිමින් අභිෂේකය පැවැත් වූ බව ද කියවේ.

අන්තර්ගතය සකස් කිරීම : අයි.එම්. ධම්මික කුමාර ඉලන්කෝන් මයා - ගුරු උපදේශක - කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## VI වැනි පැරකුම්බා රජුගේ අවධියේ සිදු වූ වැදගත් සිදුවීම්

- **දකුණු ඉන්දීය විජයනගර් අධිරාජයා විසින් එල්ල කරන ලද ආක්‍රමණයක් මැඩපැවැත්වීම.**

"චතුස්සාගර පරියන්ත කොට විරිදු පිඹවූ කණ්ණඩි රජුගේ සේනාව නැව් නැගී අවුත් ගොඩ බට කල්හි පරාක්‍රමබාහු රජතුමා හමුදා යවා ඔවුන් හා යුධ කොට ජය ගෙන සකල ජම්බුද්වීපය මුළුල්ලේ ප්‍රසිද්ධ විය."

- අලකේශ්වර යුද්ධය, රාජාවලිය -

- **අදිවිරරාම පටුන ආක්‍රමණය කිරීම**

vi වැනි පරාක්‍රමබාහු රජතුමා වෙළදාම පිණිස බඩු පටවා යැවූ නැවක් අධිවිරරාම පටුනේදී රායන් මලවර නැමැත්තෙකු විසින් පැහැරගනු ලැබීය. රජු විසින් එයට පළි ගැනීම පිණිස නැව් සිය ගණනකින් හමුදාව යවා ඒ වෙළඳ තොටුපළට පහර දී සොළි රටින් මකුඩන් කෝට්ටය ඇතුළු ගම් සතකින් අවුරුදු පතා අයබදු ගෙන්වාගත් බව....

- අලකේශ්වර යුද්ධය, රාජාවලිය-

- **වන්නි රාජායන් ජයගැනීම**

කෝට්ටේ රාජ්‍යය සහ යාපනය ප්‍රාදේශීය රාජ්‍යය අතර වූ සුවිශාල වනගත ප්‍රදේශය තුළ පිහිටා තිබුණු වන්නි ජනපදවල සිටි පාලකයන් දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා කාලය තුළ දුර්වල රජවරුන් බිහි වූ විට ස්වාධීනවත්, ප්‍රබල රජවරුන් බිහි වූ විට ඔවුන් යටතේත් තම ප්‍රදේශ පාලනය කළ බව පෙනේ. කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජුගේ කාලය වන විට වන්නි නායකවරුන් ස්වාධීන පාලකයන් ලෙස කටයුතු කළ බැවින් පරාක්‍රමබාහු රජුගේ ඊළඟ කර්තව්‍යය වූයේ වන්නි පාලකයන් යටත් කර ගැනීම යි. මෙම කලාපය තුළ මහා වන්නි ජනපද 18 ක් වූ බව ගිරා සන්දේශයේ සඳහන් වේ. රජතුමා සපුමල් කුමරු යවා යාපනය රාජ්‍යයට මායිම්ව පැවති වන්නි ජනපද කීපයකට හදිසි ප්‍රහාරයක් එල්ල කොට ඒවායෙහි පාලකයන් සිරකරුවන් ලෙස තබා ගෙන යාපන රාජ්‍යයේ ආරක්ෂක සංවිධාන ආදිය පිළිබඳව තොරතුරු ලබා ගෙන ඇත. වන්නි ජනපද පක්ෂපාත කරවා ගැනීමේ දී ඇතැම් ජනපද උපායශීලීව අවනත කර ගැනීමට ද, ඇතැම් වන්නිවරුන් හමුදා බලයෙන් යටත් කර ගැනීමට ද හයවෙනි පරාක්‍රමබාහු රජු ක්‍රියා කළ බව මූලාශ්‍රවලින් හෙළි වේ. යාපනය රාජ්‍යය යටත් කර ගැනීම සඳහා වන්නි පාලකයන්ගේ පක්ෂපාතීත්වය බෙහෙවින් වැදගත් විය.

- **යාපා පටුන ජයගැනීම (ක්‍රි.ව.1449)**

මේ සමය වන විට යාපන ප්‍රදේශය පාලනය කරන ලද්දේ කණකසූරිය සිංගෙයි ආර්යන් නම් ආර්ය චක්‍රවර්ති පාලකයා ය. (යාල්පාන වෛපවමාලෙයි) ඔහුට තම පාලන කටයුතු සඳහා ඉන්දියාවේ ඒ වන විට බලවත්ව සිටි විජයනගර් අධිරාජයාගේ සහය ලැබුණි. නමුත් II වන දේවරායර නමැති විජයනගර් අධිරාජයාගේ ඇවෑමෙන් ක්‍රි.ව.1447 දී එහි බලයට පත් මල්ලිකාර්ජුන දුර්වල පාලකයෙකු වූ අතර අධිරාජ්‍යයේ බලය පිරිහුණි. ඒ හෙයින් යාපනයේ පාලක ආර්ය චක්‍රවර්තිට විජයනගර් අධාර ලැබීම අඩු විය.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

vi වැනි පැරකුම් රජු යාපන සටන මෙහෙයවීම තම පුත් තනතුරේ වැඩුණු සපුමල් කුමාරයා (චම්පික පෙරුමාල් / සෙම්බගප් පෙරුමාල් ) හට පවරන ලදි. පළමු වරට සපුමල් කුමරු යාපනයට ගොස් අවට රටවල් කිහිපයක් අල්ලාගත් අතර යාපනයට දකුණින් පිහිටි කැලෑ බද වන්නි ජනපද වල සිටි සිංහල හා දෙමළ ප්‍රාදේශීය නායකයින් යටත් කරගන්නා ලදි. (වන්නි පාලකයෝ / වන්නිවරු) දෙවන වර සපුමල් කුමරු තම සේනාව බස්නාහිර වෙරළ දිගේ මීගමුව. හලාවත, පුත්තලම, මන්නාරම හරහා යාපනයට මෙහෙයවන්නට ඇති බවත් ඔවුන්ට අවශ්‍ය ආහාර හා යුධ උපකරණ රැගෙන නාවික හමුදාව ද බටහිර වෙරළ දිගේ යාපනයට යාත්‍රා කරන්නට ඇති බවත් විශ්වාස කෙරේ. මෙම නාවික හමුදාව පොක් සමුද්‍ර සන්ධියේ මුරකාවල් හි යෙදෙන්නට ඇත.

අලිමංකඩට නුදුරු කලපුවෙන් මෙගොඩ ජාවක කෝට්ටේ දී පළමු වරට බිහිසුණු සටන් ඇති වූ අතර ඉන් ජය ගත් සපුමල් කුමරුගේ සේනා යාපා පටුනට පිවිසී ආර්යචක්‍රවර්තී පරදා ජයග්‍රහණ ලබා ගන්නා ලදි. හයවන පැරකුම් රජු විසින් සපුමල් කුමරු යාපනයේ පාලකයා ලෙස පත්කරන ලදි.

- **උඩරට ජෝතිය සිටාණන්ගේ කැරැල්ල මැඩපැවැත්වීම**

මේ අතර vi වැනි පැරකුම් රජුගේ යුවරාජ පදවිය දරමින් දැදිගම සිට පාලනය ගෙන ගිය දැදිගම පරාක්‍රමබාහු රජු මියගිය අතර දැදිගම පරාක්‍රමබාහු යුවරජුගේ පුත් පරාක්‍රම ඇපා හා ජෝතිය සිටානන් නැමැත්තෙකු උඩරට ප්‍රදේශයේ කැරළි ඇති කරන ලදි. (vi වැනි පැරකුම් රජුගේ මඩවල ලිපිය ක්‍රි.ව.1462) පසුව ජෝතිය සිටු ප්‍රබලව කැරැල්ල මෙහෙයවා ඇත. vi වැනි පැරකුම් රජු කැරැල්ල මැඩලීම සඳහා තම පුත් තනතුරේ හදා වඩා ගත් අම්බුලුගල කුමරුට පවරන ලදි. ඔහු එම කැරැල්ල සාර්ථකව මැඩපවත්වන ලද අතර රිවිකුල කුමරු හට එම ප්‍රදේශයේ පාලනය භාර කර ඇත.

- **උඩරට සේනා සම්මත වික්‍රමබාහුගේ කැරැල්ල**

මාතලේ ප්‍රදේශයේ පැන නැගුණු මොහු උඩරට ප්‍රදේශයේ කැරැල්ලක් ඇති කළ අතර කැරැල්ල මැඩලීම සඳහා රිවි කුල කුමරු උඩරටට ගිය අතර සිදුවූ සටනින් රිවි කුල කුමරු හෙවත් දැදිගම පරාක්‍රම ඇපා කුමරු වෙල්ලස්සේ දොඩම්වෙලට පළා යන ලදි. වික්‍රමබාහු සේනා සම්මත වික්‍රමබාහු නමින් ක්‍රි.ව.1463 දී සෙංකඩගල රජ විය. පුරප්පාඩු වූ සතර කෝරළයේ (දැදිගම) පාලක තනතුරට සපුමල් කුමරුගේ සහෝදරයා පත් කරන ලද අතර ඔහු තම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරාගනු ලැබුවේ අම්බුළුගල ප්‍රදේශයයි. එතැන් සිට ඔහු අම්බුළුගල කුමාරයා නම් විය.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ජයබාහු - (ක්‍රි.ව.1467 - 1469 )

vi පරාක්‍රමබාහු රජුගේ මරණින් පසුව එතුමාගේ දියණිය වූ උලකුඩය දේවියගේ හා නන්නුරුතුනයාර් මැතිතුමාගේ පුතා ශ්‍රී රාහුල හිමියන්ගේ හා ප්‍රභූන්ගේ අනුග්‍රහයෙන් රජ බවට පත් ව ඇත.

## vi වැනි බුවනෙකබාහු (ක්‍රි.ව.1469 - 1480)

ජයබාහු බලයට පත් වූ බව ඇසූ යාපනයේ සිටි සපුමල් කුමරු සේනාවක් රැගෙන විත් ජයබාහු මරා vi වැනි බුවනෙකබාහු නමින් කෝට්ටේ රජවීම.

පස්දුන් කෝරළයේ සිරිවර්ධන ප්‍රතිරාජයන්, කුරගම හිමියාණන් යන දෙදෙනා කළු ගඟත්, වළවේ ගඟත් අතර ප්‍රදේශයේ රජුට විරුද්ධව කැරළි ගැසීම. සිංහල පෙරළිය. සිංහල සංගය යන නම් වලින් හඳුන්වන එම කැරැල්ල වසර 05 ක් පමණ පැවති බවට සාධක ඇත. රජු අම්බුළුගල කුමාරයාගේ සහයෙන් කැරැල්ල මැඩලා කැරළිකරුවන් සිරගත කරන ලදි. ( සපුමල් කුමරුට දෙමළ ජන්මයක් තිබීමත්, යාපනයේ සිට කෝට්ටේට පැමිණෙන විට යාපනයේ දෙමළ සේනාවේ ප්‍රධානීන් ද රැගෙන ඒමත් කෝට්ටේ රාජ සභාවේ ප්‍රධානීන්ගේ විරෝධය හා ජයබාහු රජු මරා දැමීම මෙම සිංහල සංගයට හේතුවන්නට ඇත.)

සිංහල සංගය මැඩලීම සඳහා අම්බුළුගල කුමරු කෝට්ටේට පැමිණි පසු කන්ද උඩරට සේනාසම්මත වික්‍රමබාහු සතර කෝරළයේ ( මනාවුළුපුරය) ජන ප්‍රධානීන්ගේ සහය ලබාගෙන එහි බලය අල්ලා ගැනීම

( ක්‍රි.ව.1471 සේනා සම්මත වික්‍රමබාහුගේ ගඩලාදෙනි ලිපිය / අස්ගිරි තල්පත)

vi බුවනෙකබාහු රජු දැදිගමට පැමිණ උපාය මාර්ගිකව සතර කෝරළයේ ජන ප්‍රධානින් තමන්ට පක්ෂ කරගෙන නැවත සතර කෝරළයේ පාලන බලය අම්බුළුගල කුමරුට ලබාදීම .(vi වැනි බුවනෙකබාහු රජුගේ දැදිගම පුවරු සෙල්ලිපිය - ක්‍රි.ව.1478 )

vi වැනි බුවනෙකබාහු රජු ඔහුගේ මරණයට පෙර. තමාට විරුද්ධව සිංහල සංගය මෙහෙයවා තමා විසින්ම සිරගත කරන ලද සිරිවර්ධන ප්‍රතිරාජයන් හා කුරගම හිමියන් නිදහස් කොට තම පුත් වයිපුර බණ්ඩාරගේ ආරක්ෂකයින් ලෙස පත් කිරීම

Copyright © www.e-thaksalawa.moe.gov.lk



Copyright © www.e-thaksalawa.moe.gov.lk

## VII වැනි පණ්ඩිත පරාක්‍රමබාහු (ක්‍රි.ව.1480 - 1490)

vi බුවනෙකබාහු රජුගේ මරණින් පසුව එතුමාගේ බිසව වූ ධනමැණිකා රත්නාවලි බිසව තෙමසක් රජ්‍ය විචාරීම. කුමරු නියමිත වයසට පැමිණ රජ වන තෙක් ප්‍රතිරාජවරුන් පාලන කටයුතු සිදු කළ බව ක්වේරෝස් පියතුමාගේ වාර්තාවල සඳහන් වේ.

## viii වැනි වීර පරාක්‍රමබාහු (අම්බුළුගල කුමරු) (ක්‍රි.ව.1490 - 1509)

vi වැනි බුවනෙකබාහු රජුගේ මරණින් පසුව ඔහුගේ පුත් වයිපුර බණ්ඩාර පණ්ඩිත පරාක්‍රමබාහු නමින් රජ වූ බව ඇසූ අම්බුළුගල කුමරු සතර කෝරළයේ සිට සේනාවක් රැගෙන කෝට්ටෙට වෙත එමින් සිටිය දී කැළණිය අසලදී පණ්ඩිත පරාක්‍රමබාහු වෙනුවෙන් පෙනී සිටි සිරිවර්ධන ප්‍රතිරාජයන් කුරගම් හිමියන් සමග බිහිසුනු සටනක් ඇති වූ අතර එම සටනින් ජයගත් අම්බුළුගල කුමරු ජයවර්ධනපුරයට ගොස් පණ්ඩිත පරාක්‍රමබාහු මරා වීර පරාක්‍රමබාහු නමින් කෝට්ටේ රජ වීම. එතුමා බලයේ සිටියේදී ම තම දරුවන් පස්දෙනාට ප්‍රදේශ 05 ක වැඩ කටයුතු පවරන ලදි.

- පරාක්‍රමබාහු - කොළඹ අවට ප්‍රදේශය
- ජයබාහු - දෙවුන්දර (චක්‍රායුධ කුමරු)
- රාජසිංහ - මැණික්කඩවර (සතර කෝරළය )
- සකළ කලා වල්ලභ - ගම්පොළ ප්‍රදේශයේ උඩුගම්පොළ - (යුවරාජ )
- තනිය වල්ලභ - හලාවත මාදම්පේ ප්‍රදේශයේ

කායල පට්ටනමේ කදිරා හෙවත් කදිරා සරායන් නම් මුස්ලිම් වෙළෙන්දෙක් හලාවතට ගොඩ බැස බලහත්කාරයෙන් මුතු කිමිදීම හා ඇත් දඩයමේ යෙදුණ අතර සකල කලා වල්ලභ හා තනිය වල්ලභ එම ආක්‍රමණිකයා මැඩ පැවැත්වීම. ක්‍රි.ව.1505 දී පෘතුගීසීන් ලංකාවට පැමිණීම (මේ අවස්ථාවේ කෝට්ටේ රජකමට පත්ව සිටියේ viii වැනි වීර පරාක්‍රමබාහුගේ පුත් ධර්ම පරාක්‍රමබාහු බවට ද මතයක් ඇත. නමුත් මූලාශ්‍ර අනුව VIII වන වීර පරාක්‍රමබාහු වෙනුවෙන් ධර්ම පරාක්‍රමබාහු කොළඹ ප්‍රදේශයේ පාලන කටයුතු මෙහෙය වීමක් පමණක් සිදුව ඇති බව පෙනේ)

රජුගේ මරණින් පසු මහා සේනාව හා මන්ත්‍රිවරු යුවරාජ සකලකලා වල්ලභ කුමරුට රාජ්‍ය ලබා ගන්නා ලෙස ආරාධනා කිරීම හා සකල කලා කුමරු එය ප්‍රතික්ෂේප කොට විජයබාහු කුමරු කෝට්ටේ රජ කරවා තමා උඩුගම්පොල සිට පාලනය කිරීම


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## vi වන විජයබාහු

- විජයබා කොල්ලය සිදුවීම . (විජයබා කෝඩේ)
- රාජ්‍ය කොටස්වලට බෙදා පාලනය
  1. බුවනෙකබාහු - කෝට්ටේ
  2. පරරාජසිංහ - රයිගම (රයිගම් බණ්ඩාර/රයිගම රාජසිංහ)
  3. මායාදුන්නේ - සීතාවක

## vii වන බුවනෙකබාහු

## ධර්මපාල කුමරු (දොන් ජුවාන් පෙරිය බණ්ඩාර/ දොන් ජුවන් ප්‍රොපෙන්දරා)



අන්තර්ගතය සකස් කිරීම : අයි.එම්. ධම්මික කුමාර ඉලන්කෝන් මයා - ගුරු උපදේශක - කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk



## විජයබා කොල්ලය

හයවන විජයබාහු රජතුමාට දරුවන් පස්දෙනෙකු විය. එතුමාගේ අග බිසවට දාව බුවනෙකබාහු, පරරාජසිංහ හා මායාදුන්නේ නමින් දරුවන් තිදෙනෙකු සිටි අතර අග බිසව වූ මහ බිසෝ බණ්ඩාරගේ නැගනියට රජුට දාව දේවරාජ නම් කුමාරයෙක් ලැබීය. විජයබාහු රජුගේ යුවරාජ වශයෙන් කටයුතු කර ඇත්තේ කලින් රාජ පදවිය ප්‍රතික්ෂේප කල සකල කලා වල්ලභ කුමරුය. සකල කලා වල්ලභ රජුගේ අභාවයෙන් පසු පුරප්පාඩු වූ යුවරාජ පදවිය හිමි විය යුතුව තිබුනේ vi වන විජයබාහු රජුගේ වැඩිමහල් පුතු වූ බුවනෙකබාහු කුමරු හටය. නමුත් මෙම පෙර සිරිත කඩ කරමින් විජයබාහු රජතුමා විසින් යුවරාජ පදවිය දේවරාජ කුමරු හට ලබා දී තමාගෙන් පසු රජ පදවිය ද ඔහුට ලබා දීමට සැලසුම් කර ඇත. මේ නිසා තම උරුමය අහිමිවනු දුටු මායාදුන්නේ, බුවනෙකබාහු, පරරාජසිංහ යන කුමාරවරුන් තිදෙනා එවකට උඩරට පාලකයාව සිටි ජයවීර බණ්ඩාර ගෙන් හමුදා ආධාර ලබාගෙන තම පියාට එරෙහිව සටන් වදිනු සඳහා කැලණියේ වාඩි ලාගන්නා ලදි.

මෙම තත්වය හමුවේ බියට පත් විජයබාහු රජතුමා කුමාරවරුන් සමගින් සාමදාන වන මුවාවෙන් ඔවුන් ගෙන්වා සිරභාරයට ගැනීමට සැලසුම් කොට තිබිණි. මේ වන විට විජයබාහු රජුට ආරක්ෂාව සපයමින් සිටියේ ඒකනායක මහත්තේ (ඒක නායක පෙරුමාල් ) හා කඳුරේ බණ්ඩාර යන මුදලිවරුන් දෙදෙනාය. සාමදාන වීමට නම් එම මුදලිවරුන් දෙදෙනා පාවාදිය යුතු කුමාර වරුන් තිදෙනා ප්‍රකාශ කලෙන් ඔවුන් දෙදෙනා කුමාරුවරුන් වෙත යැවීමට viවන විජයබාහු රජුට සිදු විය. ඒකනායක මුදලි අතරමග දී කැළණි විහාරයට පැන ගොස් සැඟ වී දිවි බේරාගත්ත ද කඳුරේ බණ්ඩාර කුමාරුවරුන් අතින් මරණයට පත්විය.

කුමාරවරු තිදෙනා හොර රහසේ ම තම සේනා කෝට්ටේ දෙසට මෙහෙය වූ අතර විජයබාහු රජතුමා කුමාරවරු අල්ලා ගැනීම සඳහා රහසිගත බල ඇණියක් කුඩාවත්ත ප්‍රදේශයේ සඟවා දොරගුළු ලා මාලිගාව තුළට වී සිටින ලදී. මෙම තත්වය හත් හැවිරිදි ළාබාල දේවරාජ කුමරු, කුමාරවරු තිදෙනාට සැලකර සිටි අතර කුමාරවරු මාළිගාවෙන් එළියට විත් කෝට්ටේ නතරකර සිටි සේනාවට නුවර කොල්ල කන්නට අණ කරන ලදි. ඔවුන් රාජ මාළිගය ද කොල්ල කන ලදී. රාත්‍රියේ දී සලමාන් නැමැත්තෙකු ලවා රජතුමා මරවා පසුදා උදෑසන මාලිගය සරසා වැඩිමහලු බුවනෙකබාහු කුමාරයා අභිෂේක කරවන ලදි. ක්‍රි.ව.1521 දී සිදු වූ මෙම විජයබා කොල්ලය හෙවත් විජයබා කෝඩේ ලෙස හඳුන්වනු ලැබේ.

මෙම සිදුවීමෙන් අනතුරුව බුවනෙකබාහු කුමරු නීත්‍යානුකූල රජු ලෙස කෝට්ටේ බලයට පත් වූ අතර රයිගම් බණ්ඩාර හෙවත් පරරාජසිංහ කුමරුට බෙන්තර වළල්ලාවිට කෝරළය ඇතුළු ප්‍රදේශයේ පාලනය ද, මායාදුන්නේ කුමරුට සතර කෝරළයේ ප්‍රදේශයේ පාලනයත් බාර විය. කෙටි කාලයකින් යුවරාජ පදවිය හිමි විය යුතුව සිටි පරරාජසිංහ රජු මිය ගිය අතර ඔහුට අයත්ව තිබූ ප්‍රදේශය ද මායාදුන්නේගේ පාලනය යටතට ගැනිණි. මේ සමගින් බුවනෙකබාහු රජු හා මායාදුන්නේ රජු අතර මතභේද ඇති වෙන්නට විය. වර්ධනය වෙමින් පැවති මෙම තත්වය හමුවේ ප්‍රයෝජනයට ගත් පෘතුගීසීන් කෝට්ටේ පාලනයට සම්බන්ධ විය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : අයි.එම්. ධම්මික කුමාර ඉලන්කෝන් මයා - ගුරු උපදේශක - කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

අකමැත්තෙන් වුවද මායාදුන්නේන්ගෙන් එල්ලවන තර්ජන හමුවේ බුවනෙකබාහු රජුට පෘතුගීසීන්ගේ සහය පැතීමටත් ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කරන්නටත් සිදු විය. බුවනෙකබාහු රජතුමාගෙන් පසුව රාජ්‍ය ලබා ගැනීමට ඔහුට දරුවෙකු නොවීය. පෙර සිරිතට අනුව මායාදුන්නේට ඒ සඳහා අයිතියත්, උරුමයත් තිබුණි. නමුත් බුවනෙකබාහු රජුට අවශ්‍ය වූයේ තම දියණිය වූ සමුද්‍ර දේවියගේ බාලපුත් ධර්මපාල කුමරුට රාජ්‍ය හිමිකර දීමට ය. බාධක හමුවේ පෘතුගීසින්ගේ සහයෙන් ධර්මපාල කුමරු බුවනෙකබාහු රජුගෙන් පසුව බෞතිස්ම ලබා දොන් ජුවන් ධර්මපාල නමින් කෝට්ටේ රජ විය.

## කෝට්ටේ රාජ්‍ය බිඳවැටීම

පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට ශ්‍රී ලංකාවේ පාලනය කෝට්ටේ , කන්ද උඩරට හා යාපනය ලෙස කොටස් වලට බෙදී පැවතුනි. ක්‍රි.ව..1521 දී සිදු වූ විජයබා කොල්ලය හේතුවෙන් කෝට්ටේ රාජ්‍ය කෝට්ටේ, රයිගම සීතාවක යනුවෙන් කොටස් තුනකට බෙදුණි. කෝට්ටේ රාජ්‍යයේ අවසාන සමය වන විට දේශපාලන අතින් අභ්‍යන්තර අවුල් වියවුල් රැසක් ඇති වූ බව පෙනේ.

අටවන වීරපරාක්‍රමබාහු රජුගෙන් පසුව එතුමාගේ යුවරාජ සකල කලා වල්ලභ කුමරු බලයට පත්විය යුතු වුවත් අග බිසවගේ පුත් විජයබාහු කුමරු රාජ්‍ය බලය ලබා ගැනීමට පෘතුගීසීන්ගේ සහය පැතීම නිසා සකලකලා කුමරු රජ පදවිය ප්‍රතික්ෂප කරන ලදි. හයවන විජයබාහු රජ අවධියේ දී පෙර සිරිත කඩ කරමින් වැඩිමහල් සහෝදරවරු සිටියදී ලාබාල දේවරාජ කුමරුට රාජ්‍ය බලය ලබාදීමට උත්සාහ කිරීම නිසා විජයබා කොල්ලය ඇති විය. කෝට්ටේ රාජ්‍ය කෝට්ටේ සීතාවක, රයිගම යනුවෙන් කොටස් 03 කට බෙදී වෙන් විය. පරරාජසිංහ හෙවත් රයිගම් බණ්ඩාරගේ ඇවෑමෙන් ඔහුට අයත් ව තිබූ පාලන ප්‍රදේශය ද මායාදුන්නේ විසින් අල්ලා ගැනීම නිසා කෝට්ටේ බුවනෙකබාහු රජු හා මායදුන්ගේ රජු අතර ආරවුල් ඇති විය. මායාදුන්නගෙන් ආරක්ෂාව පතා බුවනෙකබාහු රජතුමා විසින් පෘතුගීසීන්ගේ සහය ලබා ගැනීම නිසා පෘතුගීසීන් කෝට්ටේ රාජ්‍ය පාලනයට සම්බන්ධ විය. බුවනෙකබාහු රජතුමාගෙන් අනතුරුව රාජ්‍ය උරුමය පැවතියේ මායාදුන්නේ කුමරු හටය. නමුත් බුවනෙකබාහු රජතුමා තමාගෙන් පසුව කෝට්ටේ රාජ්‍ය තමාගේ දියණිය වූ සමුද්‍ර දේවියගේ පුත් ධර්මපාල අස්ථාන කුමරුට පැවරීමට සැලසුම් කල අතර එය පෙර සිරිත කඩ කිරීමකි. ඒ පිළිබඳ මායාදුන්නේ උරණ වූ අතර දෙපිරිස අතර සටන් කීපයක් ම සිදුවිය. එමගින් අභ්‍යන්තර මතභේද උග්‍ර විය.

හත්වන බුවනෙකබාහු රජතුමා මෙම තත්වයන් හමුවේ බොහෝ අපහසුතාවයට පත් වූ අතර අසරණ විය. අවසානයේ එතුමා කැළණි මාළිගාවේ දී වෙඩිවැදී මියගිය අතර ඉන් අනතුරුව ධර්මපාල කුමරු සිංහාසනයේ තබා ඔහුගේ පියා වූ වීදිය බණ්ඩාර රාජ්‍ය පාලනය කරන ලදි. අභ්‍යන්තර වියවුල් හමුවේ වීදිය බණ්ඩාරට ද පලායාමට සිදුවිය. ඉන් අනතුරුව ධර්මපාල කුමරුට පෘතුගීසින්ගේ අත නැටවෙන රූකඩයක් ලෙස ක්‍රියාකරන්නට සිදු විය. චෝළ සම්භවයකින් යුත් තම්මිට බණ්ඩාර, ශ්‍රී රාධාරක්ෂ පණ්ඩිත වැනි ප්‍රභූන් පිරිසක් පිරිවරාගෙන සිටි ධර්මපාල කුමරු රජු වශයෙන් පිළිගැනීමට සිංහල ප්‍රභූවරුන් හා භික්ෂූන් වහන්සේලා මැළි විය. මේ තත්වය හා පෘතුගීසි බලවේග ඉවසනු බැරි වූ බොහෝ අය සීතාවක මායාදුන්නේ වෙත ගොස් සහය ලබා දී ඇත.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

මේ හේතුවෙන් ස්වදේශිකයින් විසින් ධර්මපාල රජු නොසලකාහැරීමටත් මායදුන්නේ රජුගේ බලය වැඩි වීමටත් හේතුවිය. ක්‍රි.ව.1557 දී ධර්මපාල රජු බුදු දහම අතහැර කතෝලික ආගම වැළඳ ගෙන දොන් ජුවන් ප්‍රොපෙන්දරා (දොන් ජුවාන් පෙරිය බණ්ඩාර) නමින් බෞතිස්ම ලැබීමත් නිසා මෙම තත්වය තවදුරටත් වර්ධනය විය.

මේ තත්වය යටතේ ක්‍රි.ව.1557- 1562 අතර කාලය තුල කෝට්ටේ හා සීතාවක අතර ජය පරාජය තීරණය නොවූ සටන් රාශියක් ම සිදු විය. නමුත් ක්‍රි.ව.1562 දී රාජසිංහ (සීතාවක රාජසිංහ) කුමරු හා වික්‍රමසිංහ මුදලි යටතේ සේනා සංවිධානය කල මායාදුන්නේ රජු කොළඹ හා කෝට්ටේ නගර වලට එකවර පහර දීමේ සටනක් මෙහෙය වූ අතර එහි දී මුල්ලේරියා ප්‍රදේශයේ සිදු වූ සටනකින් පෘතුගීසින්ට අන්ත පරාජයක් අත් විය. එහි දී පෘතුගීසි භටයින් 1600 ක් මිය යන ලදී. මේ වන විට කෝට්ටේ ආරක්ෂකයින් ලෙස කටයුතු කර ඇත්තේ පෘතුගීසින් ය. මෙම සටන් ව්‍යාපාරය හමුවේ ධර්මපාල රජු කෝට්ටේ රාජ්‍ය හා කොළඹ කොටුව එකවර ආරක්ෂා කිරීමේ ප්‍රබල අභියෝගයකට මුහුණ දීමට පෘතුගීසින්ට සිදු විය. පෘතුගීසින් ඊට විසඳුමක් ලෙස කෝට්ටේ ධර්මපාල රජු කෝට්ටේ නගරයෙන් ඉවත් කර කොළඹ කොටුවට රැගෙන යන ලදි. මේ හේතුවෙන් ගම්පොල යුගයේ දී අලගක්කෝණාර ප්‍රභූවරයා විසින් උතුරේ ආර්යචක්‍රවර්ති ගේ බලය මැඩලීම සඳහා ආරක්ෂිත බලකොටුවක් ලෙස ඇරඹි, කෝට්ටේ ක්‍රි.ව.1415 දී පටන් ශ්‍රී ලංකාධීශ්වර අගරජුගේ අගනුවර ලෙස සැලකුනි. ක්‍රි.ව.1577 දී ධර්මපාල රජුට වස දී මැරීමට තැත්කර ඇති අතර එමගින් ඔහු මිය නොගිය ද, ඇඩි සේ රෝගාතුර වූ බව කියවේ. අවසාන අවධියේ දී බයෙන් සැකෙන් හා දුක්ඛිත ලෙස ජීවිතය ගත කල රජතුමා ෆ්‍රැන්සිස්කානු පූජකවරුවන්ගේ ඉල්ලීම පිළිගෙන කි.ව.1580 අගෝස්තු 12 දින තෑගි ඔප්පුවක් මගින් කෝට්ටේ රාජ්‍යයේ අයිතිය පෘතුගාලයේ රජුට පවරන ලදි. ක්‍රි.ව.1597 ධර්මපාලගේ මරණින් පසු කෝට්ටේ රාජ්‍ය පෘතුගීසින් අතට පත්විය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## කෝට්ටේ යුගයේ අධ්‍යාපනික හා සාහිත්‍යය කටයුතු

කෝට්ටේ යුගය අධ්‍යාපනික හා සාහිත්‍ය කටයුතු අතිශයින් දීප්තිමත් ප්‍රසිද්ධ වකවානුවකි. හය වෙනි පරාක්‍රමබාහු රාජ්‍ය කාලයේ (ක්‍රි.ව.1415-1464) ඇති වූ දේශපාලන ඒකියත්වය රාජ හා ප්‍රභූ අනුග්‍රහය. ශාසනික තත්ත්වය යථා තත්ත්වයට පත්වීම හා සාමකාලීනව පඬිවරු රැසක් බිහිවීම වැනි කරුණු මීට හේතු වී ඇත.

පැරණි යුගවල විවිධ නම් වලින් හැඳින්වුණු භික්ෂු අධ්‍යාපන ආයතන පිරිවෙන් නමින් ප්‍රකට ව ඉමහත් දියුණුවක් ලැබුයේ මේ රාජ්‍ය කාලයේදී ය. සමකාලීන සාහිත්‍ය කෘතිවල හා සෙල්ලිපි වල අධ්‍යාපනික දියුණුවට උපස්ථම්භක වූ පිරිවෙන් රාශියක් ගැන සඳහන් වන අතර පහත සඳහන් පිරිවෙන් ඒවා අතර වඩා ප්‍රකට ය.

1) තොටගමුවේ විජයබා පිරිවෙණ
2) විදාගම ශ්‍රී ඝණානන්ද පිරිවෙණ
3) දෙවිනුවර ඉරුගල් කුලතිලක පිරිවෙණ
4) කැරගල පද්මාවතී පිරිවෙණ
5) පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙණ
6) උස්සාපිටියේ මහාපාය පිරිවෙණ

මෙයින් ග්‍රාමවාසි නිකායට අයත් තොටගමුවේ විජයබා පිරිවෙණ ගැන විස්තරයක් ගිරා සන්දේශයේ දැක්වේ. තොටගමුවේ ශ්‍රී රාහුල මා හිමියෝ එහි පිරිවෙන්පති පදවිය හෙබවූහ. වනවාසි නිකායට අයත් කැරගල පද්මාවතී පිරිවෙණ පිළිබඳ දීර්ඝ විස්තරයක් හංස සන්දේශයේ සඳහන් වේ. එහි සමකාලින පිරිවෙන් පති පදවිය හෙබවූවේ කැරගල වනරතන මා හිමියන් ය.

කෝට්ටේ යුගයේ අධ්‍යාපන දියුණුවට උපස්ථම්භක වූ මේ පිරිවෙන් ක්‍රමානුකූල අධ්‍යාපන පටිපාටියක් අනුව ගිහි - පැවිදි දෙපක්ෂයටම අධ්‍යාපනය ලබාදුන් ආයතන වූ බව සමකාලීන සාහිත්‍ය කෘති වලින් අනාවරණය වී ඇත. දේශීය සිසුන් පමණක් නොව විදේශීය සිසුන් ද මේවා හි අධ්‍යාපනය ලබා ඇත. ශ්‍රී රාමචන්ද්‍ර භාරති නම් ප්‍රසිද්ධ ඉන්දියානු සංස්කෘත පඬිවරයා තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ ශිෂ්‍යයෙකු ලෙස සඳහන් වෙයි. මේ පිරිවෙන් වල සිංහල, පාලි, සංස්කෘත. ප්‍රාකෘත හා දෙමළ වැනි භාෂා මෙන් ම කාව්‍ය, නාටක ජ්‍යෝතිෂ විද්‍යාව වැනි ලෞකික විෂයන් ඉගැන් වූ අතර ප්‍රධාන විෂය වූයේ බුද්ධ ධර්මයයි. මහායාන බුදු සමය ද සංස්කෘත භාෂාව ආශ්‍රයෙන් මෙහි ඉගැන්නූ අතර බෞද්ධ ඉගැන්වීම් ක්‍රම අනුව ගිහි පැවිදි දෙපක්ෂයටම මනා හික්මීමක් ලබා දීම පිරිවෙන්වල මූලික පරමාර්ථය විය.

copyright © www.e-thaksalawa.moe.gov.lk


Copyright © www.e-thaksalawa.moe.gov.lk

මේ පිරිවෙන් මගින් ඇති වූ අධ්‍යාපන දියුණුවට උගතෙකු වූ හය වෙනි පරාක්‍රමබාහු රජුගේ අනුග්‍රහය මෙන් ම සමකාලීන ගිහි - පැවිදි උගත් පඬිවරුන්ගේ දායකත්වය ද විශේෂයෙන් උපස්ථම්භක වී ඇත. තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමි, විදාගම මෛත්‍රීය මාහිමි හා කැරගල පද්මාවතී පිරිවෙන්පති, වනරතන මාහිමි මෙකල ප්‍රකට උගත් යතිවරු වූහ. සිය අධ්‍යාපන ආයතන වල අධ්‍යාපනික කටයුතු වල නියැලෙමින් හා ග්‍රන්ථකරණයෙන් මේ තෙරවරු සුවිශාල අධ්‍යාපනික හා සාහිත්‍ය මෙහෙවරක් කළහ. ගිහි පඬිවරු අතර හය වෙහි පරාක්‍රමබාහු රජු. නන්නූර්තුනෙයාර් හා ශ්‍රී රාමචන්ද්‍ර භාරති යන අය ප්‍රකට වූහ. කෝට්ටේ යුගයේ මේ අධ්‍යාපන පසුබිමෙහි සාහිත්‍ය කටයුතු වල ද ඉමහත් දියුණුවක් ඇති විය. මේ යුගයේ රචනා වූ සාහිත්‍යාංග, ග්‍රන්ථ හා ඒවා රචනා කල කතුවරයන් පිළිබඳ ව පහත සඳහන් සටහන ඉදිරිපත් කළ හැක.

- මහා කාව්‍ය - කාව්‍යශේඛරය (තොටගමුවේ රාහුල හිමි)
- ඛණ්ඩකාව්‍ය - ගුත්තිල කාව්‍යය ( වැත්තෑවේ හිමි )
  - බුදුගුණාලංකාරය (විදාගම මෛත්‍රීය හිමි)
- සන්දේශ කාව්‍ය - පරවි සන්දේශය (තොටගමුවේ රාහුල හිමි)
  - සැළලිහිණි සන්දේශය (තොටගමුවේ රාහුල හිමි)
  - ගිරා සන්දේශය
  - හංස සන්දේශය
  - කෝකිල සන්දේශය (තිලක පිරිවෙන්පති හිමි)
- උපදේශ කාව්‍ය - ලෝවැඩ සඟරාව
- ප්‍රශස්ති කාව්‍ය - පැරකුම්බා සිරිත
- ශිලෝ කාව්‍ය - එළු ශිලෝ ශතකය
- කෝෂ ග්‍රන්ථ - පියුම් ලකුණ , රුවන්මල
- ගද්‍ය ග්‍රන්ථ - සද්ධර්මරත්නාකරය ( ධම්මදින්න විමලකිත්ති හිමි)

මේ ග්‍රන්ථ අනුව පෙනෙන එක් ලක්ෂණයක් ලෙස කෝට්ටේ යුගයේ දී පද්‍ය කාව්‍ය ජනප්‍රිය වීම හා ගද්‍ය සාහිත්‍ය එක්තරා පරිහානියක් දක්නට ලැබීම දැක්විය හැක. කෙසේ වුවත් විවිධ ක්ෂේත්‍ර යන්ට අදාළ ව විශිෂ්ට සාහිත්‍ය ග්‍රන්ථ ලියැවුණු කෝට්ටේ යුගය සිංහල සාහිත්‍ය ඉතිහාසයෙහි "ස්වර්ණමය යුගය" ලෙස ඇතමෙක් හඳුන්වති. මේ සියල්ලෙන් ප්‍රකට වන්නේ කෝට්ටේ යුගයේ අධ්‍යාපනික හා සාහිත්‍ය කටයුතුවල ඉමහත් අභි සංවර්ධනයයි.

Copyright © www.e-thaksalawa.moe.gov.lk


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## පෘතුගීසීන් හට කෝට්ටේ රාජ්‍යයේ දේශපාලන බලය අත්පත් කර ගැනීමට ආධාර වූ ප්‍රධාන සාධක

- රට අභ්‍යන්තරයේ පැවති දේශපාලන ව්‍යාකූල භාවයෙන් පෘතුගීසින් උපරිම ප්‍රයෝජන ගැනීම. පෘතුගීසින් ශ්‍රී ලංකාවට පැමිණෙන විට කෝට්ටේ , කන්ද උඩරට හා යාපනය යනුවෙන් අභ්‍යන්තර රාජ්‍ය තුනක් වූ අතර 1521 විජයබා කොල්ලය නිසා කෝට්ටේ රාජ්‍යයද කෝට්ටේ, සීතාවක හා රයිගම් යනුවෙන් කොටස් තුනකට බෙදුණි.
- සත්වන බුවනෙකබාහු රජුගේ හා ධර්මපාල රජුගේ ක්‍රියා කලාපය සීතාවක මායාදුන්නේගෙන් ඇති වූ තර්ජන නිසා VII බුවනෙකබා රජු පෘතුගීසි ආධාර නිරන්තරයෙන් ලබාගත් අතර ධර්මපාල රජු තෑගි ඔප්පුවකින් කෝට්ටේ රාජ්‍යයේ නීත්‍යානුකූල අයිතිය පෘතුගාල රජුට පවරා ඇත.
- සීතාවක රාජධානියේ බිඳ වැටීම, පෘතුගීසින්ට ප්‍රබල අභියෝගයක් වූ සීතාවක රාජ්‍යය පළමු වන රාජසිංහ රජුගෙන් පසු පරිහානියට පත්විය.
- මල්වානේ ගිවිසුම ක්‍රි.ව. 1597 ඇති වූ මේ ගිවිසුමෙන් කෝට්ටේ සිංහල ප්‍රධානීන් පෘතුගීසි ආධිපත්‍යය පිළිගැනීමට එකඟ වූ අතර පෘතුගීසි රජු වෙනුවෙන් දොන් ජෙරනිමෝ ද අසවේදු සිංහල සිරිත් අනුව කෝට්ටේ රාජ්‍යය පාලනය කිරීමට එකඟ වී ඇත.
- ශ්‍රී ලංකාවේ රජුන්ට නාවුක බලයක් නොමැති වීම.
- දියුණු අවි ආයුධ හා පුහුණු හමුදාවක් සිංහලයන් නොවීම.
- දේශීය පාලකයන් අතර පැවති අසමගිය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ප්‍රශ්නෝත්තර සාකච්ඡාව

- **මෙම පාඩම ඇසුරින් ඇසිය හැකි ප්‍රශ්න හා ඒවාට පිළිතුරු සැපයීමට යොදාගත හැකි දළ සැලැස්ම**

### 1) කෝට්ටේ යුගයේ සංස්කෘතික වර්ධනය ( කෙටි සටහන් )

- මෙහිලා අධ්‍යාපන හා සාහිත්‍ය අංශ වඩාත් කැපී පෙනීම.
- VI වන පරාක්‍රමබාහු රජ සමයේ පැවති දේශපාලන, ආර්ථික, ආගමික හා ශාසනික දියුණුව මෙන් ම රාජ්‍ය අනුග්‍රහයත් අධ්‍යාපනයේ වර්ධනයට පිටුබලයක් විය.
- විදාගම ශ්‍රී ඝනානන්ද, තොටගමුවේ විජයබා, දෙවුන්දර ඉරුගල් තුලතිලක, කැරගල පද්මාවතී, පැපිලියානේ සුනේත්‍රා දේවී සහ එරබත්තොට ධර්මරාජ යන පිරිවෙන් ප්‍රකට ශාස්ත්‍රායතන වීම.
- මෙම අධ්‍යාපන ආයතනවල සිටි භික්ෂූන් වහන්සේ විශාල ධර්ම ශාස්ත්‍රීය සේවයක නිරත වීම (කැරගල වනරතන, වීදාගම මෛත්‍රීය, තොටගමුවේ ශ්‍රී රාහුල වැත්තෑවේ ආදී තෙරවරුන්
- මෙකී අධ්‍යාපන මධ්‍යස්ථානවල සිංහල, පාලි, සංස්කෘත, ප්‍රාකෘත හා දෙමළ වැනි භාෂාද කාව්‍ය, නාටක, ජ්‍යොතිර් විද්‍යා වැනි විවිධ විෂයය ද ඉගැන්වීම.
- ගිහි පැවිදි පඬිවරුන් විවිධ අංශ වලට අයත් ග්‍රන්ථ රචනයෙහි නිරත වීම (මහාකාව්‍ය, බුදුගුණ කාව්‍ය, සංදේශ කාව්‍ය, උපදේශ ග්‍රන්ථ හා ප්‍රශස්ති ග්‍රන්ථ ).
- වනවාසී හා ග්‍රාමවාසී භික්ෂූන් තරඟයට ග්‍රන්ථ කරණයෙහි නියැලීම හේතු කොට ගෙන සාහිත්‍ය ප්‍රබෝධයක් හටගැනීම. වනවාසී සම්ප්‍රදාය කැරගල පද්මාවතී පිරිවෙනෙහි ග්‍රාමවාසී සම්ප්‍රදාය තොටගමුවේ විජයබා පිරිවෙනෙහි ද ක්‍රියාත්මක වීම.
- මෙකල පැවති අධ්‍යාපන ආයතන ජාත්‍යන්තර කීර්තියට පත් වී තිබීම සංස්කෘත විශාරදයකු වූ ශ්‍රී රාමචන්ද්‍ර භාරතී පඬිවරයා දිවයිනට පැමිණීම.

copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : අයි.එම්. ධම්මික කුමාර ඉලන්කෝන් මයා - ගුරු උපදේශක - කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 2) සපුමල් කුමාරයා ( කෙටි සටහන්)

- අවසාන වරට ලංකාව එක්සේසත් කළ හයවන පරාක්‍රමබාහු රජුගේ (ක්‍රි. ව. 1412-1467) පුත් තනතුරෙහි සපුමල් කුමාරයා හැදී වැඩුණි.
- එවකට ආර්ය චක්‍රවර්තී පාලකයින් යටතේ පැවති යාපනය සහ මන්නාරම හයවන පරාක්‍රමබාහු රජු විසින් සපුමල් කුමාරයාට පවරා දෙන ලදී.
- සපුමල් කුමරු ප්‍රසිද්ධ ප්‍රහාර එල්ල කරමින් යන අතරතුර යාපනය යටත් කිරීම සඳහා වන්නි නායකයන්ගේ සහය ලබා ගත්තේය.
- කෙසේ නමුත් කෝට්ටේ රජවරුන්ගෙන් දැඩි ආක්‍රමණයක් බලාපොරොත්තු නොවුණ යාපන රාජ්‍යයේ පාලකයා වූ කනකසූරිය සිංහල රජුගේ සේනාව විසින් පරාජය කළේ ය (කෝට්ටේ සංදේශය හා සැළලිහිණි සංදේශය).
- සටනේ දී යාපන පාලකයා මියගිය බව රාජාවලියේ සඳහන් වන අතර ඔහුගේ ඥාතීන් සිංහලයන් ලෙස කෝට්ටේ රාජ්‍යයට ගෙන එනු ලැබීය (ගිරා සංදේශය).
- හයවන පරාක්‍රමබාහු රජතුමා විසින් යාපනයේ පාලකයා ලෙස සපුමල් කුමාරයා පත් කරන ලද්දේය (කෝට්ටේ සංදේශය).
- යාපනයේ ජනතාව 'සෙම්බගප් පෙරුමාල්' නමින් සපුමල් කුමාරයා හඳුන්වා ඇති අතර ඔහු නල්ලූර් නගරය මූලස්ථානය කරගෙන එහි පාලනය ගෙන ගියේය.
- යාපනයේ ආරක්ෂාවට කෝට්ටේ සේනාව නල්ලූර් නගරය ඉදිකිරීම.
- හයවන පරාක්‍රමබාහු රජතුමාගෙන් පසුව හයවන බුවනෛකබාහු නමින් ඔහු කෝට්ටේ පාලකයා බවට පත්වීම.
- ඔහුට විරුද්ධව "සිංහල සංග්‍රාමය" නමින් කැරැල්ලක් ඇති වූ අතර සපුමල් කුමාරයාගේ සහයට අඹුළුගල කුමාරයා ඉදිරිපත් විය. ඔහු මේ කැරැල්ල මැඩ පැවැත්වීය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : අයි.එම්. ධම්මික කුමාර ඉලන්කෝන් මයා - ගුරු උපදේශක - කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස තුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල

Copyright © www.e-thaksalawa.moe.gov.lk

**3). කෝට්ටේ රාජධානියට අයත් ප්‍රදේශවල පෘතුගීසීන් සිය බලය ස්ථාපිත කරගත් ආකාරය පරීක්ෂා කරන්න.**

- ප්‍රධාන වශයෙන් ආර්ථික අරමුණු ද ද්විතීයික වශයෙන් ආගමික අරමුණු ද පෙරදැරි කර ගෙන ලංකාවට පැමිණි පෘතුගීසීහු මෙරට පැවති දේශපාලන අස්ථාවරභාවය හේතු කොට ගෙන ප්‍රදේශ ආධිපත්‍යයක් ගොඩනගා ගැනීමට පෙළඹුණහ.
- පෘතුගීසීන් ක්‍රි. ව. 1505 දී ලංකාවට පැමිණෙන විට කෝට්ටේ රාජ්‍යයේ පාලකයා වූයේ අටවන වීර පරාක්‍රමබාහු රජු ය. මෙම රජු වෙළඳ ගබඩාවක් හා පල්ලියක් ඉදි කර ගැනීමට පෘතුගීසීන්ට අවසර ලබා දීම.
- ක්‍රි.ව.1521හය වන විජයබාහු රජුගේ සමයේ දී සිදු වූ 'විජයබා කොල්ලය' හේතු කොටගෙන කෝට්ටේ රාජ්‍යය කොටස් තුනකට බෙදීයාම (කෝට්ටේ - හත්වන බුවනෙකබාහු / සීතාවක - මායාදුන්නේ / රයිගම - රයිගම් බණ්ඩාර).
- පසුව VII බුවනෙකබාහු හා මායාදුන්නේ අතර හටගත් ගැටුම්වල දී කෝට්ටේ රජු වූ VII බුවනෙකබාහු පෘතුගීසීන්ගේ සහාය පැතූ අතර මායාදුන්නේ මුස්ලිම්වරුන්ගේ (කැලිකට් හි සැමොරින්ගේ ආධාර) සහාය ලබා ගැනීම. මේ සටන්වලින් VII බුවනෙකබාහු ජයගැනීම.
- ක්‍රි.ව.1550 VII බුවනෙකබාහුගේ මරණින් පසු ඔහුගේ මුනුබුරු ධර්මපාල කෝට්ටේ රජකමට පත්වූ අතර ක්‍රි.ව.1557 දී කතෝලික දහම වැළඳ ගත් ඔහු පෘතුගීසීන්ට බෙහෙවින් අවනත පාලකයෙකු වීම.
- මායාදුන්නේ හා සීතාවක රාජසිංහ යටතේ සීතාවක රාජ්‍යයේ ව්‍යාප්තියක් ඇති වූ අතර සීතාවක පාලකයෝ කෝට්ටේ පාලන බලය කොළඹට පමණක් සීමා කිරීමට සමත් වූහ.
- එහෙත් ඉන් අනතුරුව සීතාවක රාජ්‍යය සීඝ්‍ර පරිහානියකට පත්වීම. මේ අතරතුර ධර්මපාල මුළුමනින් ම පෘතුගීසීන්ගේ රූකඩ පාලකයෙකු බවට පත්වීම හා ක්‍රි.ව.1580 දී ඔහු තෑගි ඔප්පුවකින් පෘතුගීසීන්ට කෝට්ටේ රාජ්‍යය පවරා දීම.
- ඒ අනුව, ක්‍රි.ව.1597 ධර්මපාලගේ මරණින් පසු කෝට්ටේ රාජ්‍යය පෘතුගීසීන් අතට පත්වීම.
- ක්‍රි.ව.1597 දී කෝට්ටේ ප්‍රධානීන් සහ පෘතුගීසීන් අතර ඇති වී යැයි කියනු ලබන 'මල්වානේ ගිවිසුමෙන්' පෘතුගීසීන් සිය අභිමතාර්ථ සාධනය කරගැනීම.
- කෝට්ටේ රාජ්‍යයේ බලය තහවුරු කරගැනීමෙන් පසුව මෙරට පැවති දේශීය පාලන සංස්ථා උපයෝගීකර ගනිමින් පෘතුගීසීන් මෙරට වෙරළබඩ ප්‍රදේශවල පාලනය ගෙන යාම.

copyright © www.e-thaksalawa.moe.gov.lk


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 4) හයවන පරාක්‍රමබාහු රජතුමා ( කෙටි සටහන්)

- අවසන්වරට දිවයින එක්සේසත් කිරීමටත් එය පවත්වා ගෙන යාමටත් සමත් වූ පාලකයා යැයි සැලකීම. මේ රජුගේ දේශපාලන කාර්ය සංසිද්ධිය පිළිබඳ අලකේශ්වර යුද්ධය, රාජාවලිය හා සංදේශ කාව්‍ය වැනි මූලාශ්‍ර රැසක් මඟින් තොරතුරු අනාවරණය වීම.
- ක්‍රි.ව.1412 දී රයිගම බලයට පත්වීම හා ක්‍රි.ව.1415 දී ජයවර්ධනපුර කෝට්ටේ සිය අගනගරය බවට පත් කර ගැනීම. කෝට්ටේ රාජධානිය කරගත් පළමු වන පාලකයා වීම.
- දේශපාලනය:
    - වීදාගම මා හිමියන් වැනි භික්ෂූන් වහන්සේගේ අනුග්‍රහය යටතේ බලය ස්ථාවර කර ගැනීම.
    - උඩරට ප්‍රදේශවල අවනතභාවය තහවුරු කර ගැනීම.
    - වන්නි පාලකයන් අවනත කර ගැනීම.
    - තම පුත් තනතුරේ හදාවඩා ගත් සපුමල් කුමාරයා සේනාපති තනතුරට පත්කොට, එවකට ඉතා බලවත්ව සිටි යාපනයේ ආර්යචක්‍රවර්තීන් ක්‍රි.ව. 1449 දී පරාජය කොට රට එක්සේසත් කිරීම.
    - උඩරට ප්‍රදේශවල කැරලි ගැසූ ජෝතිය සිටාණන්ගේ කැරලි අම්බුළුගල කුමාරයා යොදවා මැඩපවත්වා එම ප්‍රදේශවල ආධිපත්‍යය තහවුරු කර ගැනීම.
- දකුණු ඉන්දියාවේ විජයනගර් අධිරාජ්‍යයා සමග කළ සටන හා අධිවිරරාම් පටුන ආක්‍රමණය කිරීම.

### විදේශ සබඳතා:

රූපයේ දැක්වෙන සිංහල ලේඛනය පහත පරිදි වේ:

- ඉන්දියාවේ විජයනගර් අධිරාජ්‍යා විසින් එල්ල කරන ලද ආක්‍රමණය ජය ගැනීම.
- ක්‍රි.ව.1440 ගණන්වල වෙළෙඳාමට සම්බන්ධ ගැටලුවක් මුල් කොට ගෙන දකුණු ඉන්දියාවේ අධිවිරරාම පට්ටනය (අදිවිරරාම පටුන) ආක්‍රමණය කිරීම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk


Copyright © www.e-thaksalawa.moe.gov.lk

**සංස්කෘතිය:**


- රාජ්‍ය අනුග්‍රහය අධ්‍යාපනයේ වර්ධනයට පිටුබලයක් වීම.
- පැපිලියානේ සුනේත්‍රා දේවී පිරිවෙන තම මව සිහි වීම පිණිස රජතුමා විසින් කරවන ලදී.
- වීදාගම ශ්‍රී ඝනානන්ද, තොටගමුවේ විජයබා, දෙවුන්දර ඉරුගල්කුලතිලක, කැරගල පද්මාවතී, පැපිලියානේ සුනේත්‍රාදේවී සහ එරබත්ගොඩ ධර්මරාජ වැනි පිරිවෙන් ප්‍රකට ශාස්ත්‍රායතන වීම.
    - o වීදාගම මෛත්‍රීය හිමි, කැරගල වනරතන හිමි, තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
    - o සිංහල, පාලි, සංස්කෘත, ප්‍රාකෘත හා දෙමළ වැනි භාෂාවන්ද කාව්‍ය, නාටක, ජ්‍යෝතිර්විද්‍යා, ගණිතය, චතුර්වේදය, වෛද්‍ය ශාස්ත්‍රය වැනි විවිධ විෂයන් ඉගැන්වීම.
    - o ගිහි පැවිදි පඬිවරුන් - මහා කාව්‍ය, බුදුගුණ කාව්‍ය, සන්දේශ කාව්‍ය, උපදෙස් ග්‍රන්ථ හා ප්‍රශස්ති ආදිය රචනය
    - o ජාත්‍යන්තර කීර්තියට පත් ව තිබීම නිසා විදේශවලින් ගිහි පැවිදි සිසුන් පැමිණීම. නිදසුන්: ශ්‍රී රාමචන්ද්‍ර භාරතී පඬිවරයා ශ්‍රී රාහුල මා හිමියන්ගෙන් අධ්‍යාපනය ලැබීමට තොටගමුවේ විජයබා පිරිවෙනට පැමිණීම.
    - o බුදුදහමට හා සෙසු ආගම්වලට අනුග්‍රහ දැක්වීම:
    - o තුන්මහල් දළදා මැදුරක් ඉදිකරවීම.
    - o රත්නපුර මහසමන් දේවාලය ප්‍රතිසංස්කරණය කරවීම (මහ සමන් දේවාල සන්නස)
    - o හින්දු ආගමික ස්ථානයක් වූ මුන්නේශ්වරම් දේවාලය ප්‍රතිසංස්කරණය.
    - o බ්‍රාහ්මණයන්ට අනුග්‍රහ දැක්වීම (ඔරුවල තඹ සන්නස, ගිරා සන්දේශය)
    - o කෝට්ටේ පත්තිනි දේවාලයක් ඉදිකරවීම.
    - o මෙකල දේශපාලන, ආර්ථික, ආගමික හා සංස්කෘතික යන සෑම අංශයකම පාහේ ප්‍රබෝධයක් ඇතිවීම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk


Copyright © www.e-thaksalawa.moe.gov.lk

- ලංකා සිතියමෙහි පහතින් දක්වා ඇති ස්ථාන සලකුණු කර නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| 1) කෝට්ටේ | 2) රයිගම | 3) සීතාවක | 4) මහනුවර |
| 5) යාපනය | 6) මල්වාන | 7) මුල්ලේරියාව | 8) ගාල්ල |
| 9) දෙව්න්දර | 10) කලුතර | 11) කැළණිය | 12) කලු ගඟ |
| 13 ) කැළණි ගඟ | 14) කොළඹ | 15) මීගමුව | |





Copyright © www.e-thaksalawa.moe.gov.lk